ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 29/03/21

**පැමිණිලි පාර්ශවය** : ටී.ආර්.ටී.සමරතුංග මයා,
අංක 110,රද්දල පාර,
කෑගල්ල.

**වගඋත්තර පාර්ශවය** : විදුහල්පති,
කෑගලු විද්‍යාලය,
කෑගල්ල.

**<u>පැමිණිලි අංකය : HRC/K/87/20</u>**

**පැමිණිල්ල :-**

ඉහත නම් සඳහන් පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරුගේ තෙවන දරුවා වන ජේ.ආර්.සයුල් දුල්නිත් සමරතුංග 2020 වසරේ පළමු ශ්‍රේණියට ඇතුලත් කිරීම සඳහා ස්ථාන මාරු ගණය යටතේ නියමිත කාලය තුළ අයදුම්පත් යොමු කරන ලද බවත්, ටී ආර්-42 යටතේ අදාළ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලකුණු 94 ලබා තිබී ඇති නමුත් අදාළ දරුවාගේ නම තාවකාලික ලැයිස්තුවට ඇතුළත් කර නොමැති බවත්ය.

එසේ හෙයින් පැමිණිලිකරු විසින් අභියාචනා පරීක්ෂණ මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරන ලද බවත්, 2019.12.13 දිනැති අදාළ අභියාචනා පරීක්ෂණයේදී පූර්ව සේවා ස්ථානයේ (කැබිතිගොල්ලාව ප්‍රදේශයේ) දරුවා සමඟ පදිංචිව සිටි බවට සනාථ නොවීම නිසා දරුවා ඇතුළත් කිරීම ප්‍රතික්ෂේප කර ඇති බවත් සඳහන් කර ඇත.

මෙම පැමිණිලිකරුගේ දෙවැනි දරුවා 2019 වසරේ ස්ථාන මාරු ගණය යටතේ අයදුම්කර දැනට මෙම පාසලේ 2 වන වසරේ ඉගෙනුම ලබන බැවින් තවත් ළමයෙකු ඇතුළත් කිරීමට නියෝජ්‍ය විදුහල්පති විසින් විරෝධතාවයක් දැක්වූ බවත් සඳහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர்: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு: 1996
වෙබ් / இணையம்: www.hrcsl.lk

**වගඋත්තර පාර්ශවීය සැළකිරීම :-**

**මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ,** මෙම පැමිණිලිකරුගේ පෙර රාජකාරි ස්ථානයේ පදිංචිය පිළිබඳ විමර්ශනයේදි කලත්‍රයා සමඟ (කැබිතිගොල්ලාව ප්‍රදේශයේ) පදිංචිව සිට නොමැති බවත්, හා තම පදිංචි ස්ථානය පිළිබඳ ස්ථානීය පරික්ෂාවක් සිදුකළ අවස්ථාවේ එහි පදිංචි වී නොමැති බව තහවුරු වීම නිසා සම්මුඛ පරික්ෂණ මණ්ඩලය හා අභියාචනා පරික්ෂණ මණ්ඩලය විසින්ද ඉල්ලුම්පත ප්‍රතික්ෂේප කර ඇති බවයි.

මෙම අයගේ පළමු දරුවා පාසලේ 2 වන වසරේ ඉගෙනුම ලබන බව සත්‍ය නමුත් ඒ හේතුව මත මෙම දරුවා පාසලට ඇතුළත් කිරිම ප්‍රතික්ෂේප කරන බවට නියෝජ්‍ය විදුහල්පති විසින් ප්‍රකාශ කළ බවට වන කරුණු දැක්වීම සත්‍යයෙන් තොර බවත්, මෙම අයගේ දරුවා තෝරාගෙන නොමැත්තේ පෙර සේවා ස්ථානයේ හා වර්තමාන ස්ථානයේද පදිංචිව නොමැති බවට නිරික්ෂණය වීම යන කාරණා හේතුවෙන් බවත් වගඋත්තරකරුවන් සඳහන් කර ඇත.

**නිරික්ෂණ :-**

පැමිණිල්ලේ සාරාංශය වන්නේ, තම පළමු දරුවා 2019 වසරේදී කෑගලු විද්‍යාලයට ඇතුළත් කර 2 ශ්‍රේණියේ ඉගෙනුම ලබන බවත්, දෙවන දරුවා වන **ජේ.ආර්. සයුල් දුල්නිත් සමරතුංග** 2020 පළමු වසරට ඇතුළත් කිරිමට ස්ථාන මාරු ගණය යටතේ අයදුම්පත් යොමු කර ටිආර්-42 යටතේ සම්මුඛ පරික්ෂණයට ඉදිරිපත් වී ලකුණු 94 ලබාගෙන ඇති බවත්ය.

එසේ තිබියදී සම්මුඛ පරික්ෂණ මණ්ඩලය තාවකාලිකව තෝරාගත් අයවලුන්ගේ නම් ප්‍රදර්ශනය කිරීමේදි මෙම දරුවාගේ නම තාවකාලික ලේඛනයට ඇතුළත් නොවීම හේතුවෙන් ඉදිරිපත් කරන ලද අභියාචනා ප්‍රකාරව අභියාචනා පරික්ෂණ මණ්ඩලය 2019.12.13 දින පරීක්ෂණ සිදුකර "දරුවා. කලත්‍රයා සමග එම ස්ථානයේ පදිංචි වී සිටින බව සනාථ නොවේ" යනුවෙන් සටහන් කර ලකුණු ලබා දී නොමැති බව නිරික්ෂණය වේ. මෙම අය පදිංචි වී නොසිටියේ නම් අදාළ ස්ථාන පරීක්ෂණ සිදුකර ඇති බවට සටහන් තබාගැනීම අනිවාර්යෙන් කළ යුතුව පැවතියද ඒ අනුව කටයුතු කර නොමැති බව පරික්ෂණයේදී අනාවරණය වී ඇත. පරීක්ෂණ අවස්ථාවේදී ඒ පිළිබඳව නියෝජ්‍ය විදුහල්පතිවරයාගෙන් විමසීමේදි සඳහන් කර ඇත්තේ, එම තොරතුරු අද දින රැගෙන නොආ බවත්, පසුව ඉදිරිපත් කළ හැකි බවත්ය. ඒ අනුව අදාළ තහවුරු කිරීම සිදුකරන ලෙස 2020.10.19 දිනැතිව නියෝජ්‍ය විදුහල්පතිවරයාගෙන් විමසීම් සිදුකර ඇති අතර, ඊට පිළිතුරු ලෙස විදුහල්පති විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද 2020.11.16 දිනැති

ලිපියේ අදාළ තහවුරු කිරීම් සිදුකර නොමැති අතර, ඒ සමඟ ඉදිරිපත් කර ඇති ඇමුණුමද කිසිදු හේතු සඳහන් කිරීමකින් තොරව "ප්‍රතික්ෂේපයි" යනුවෙන් දක්වා ඇත.

මෙම පැමිණිලිකරු 2017 වසරේ කැබිතිගොල්ලෑව සුරාබදු ස්ථානයේ සේවය කර ඇති අතර, 2018 වසරේදී මෙම අයගේ පළමු ළමයා ස්ථානමාරු පදනම යටතේ මෙම පාසලට ඇතුළත් කර ඇත. මෙම දරුවා ඇතුළත් කිරීම සඳහා (2020 වසර සඳහා) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලට ඉදිරිපත් කිරීමට පෙර ඉදිරිපත් කර ඇති ලේඛන 2019 ට යථාවත් කර ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරු විසින් තම දරුවා ඇතුලත් කිරීම සඳහා ස්ථාන මාරු ගණය යටතේ ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛනයේ අංක 7.33,7.6,7.6.6 යන සියලු ලේඛන නිවැරදිව ලබා දී ඇති බව තවදුරටත් නිරීක්ෂණය වී ඇත.

නමුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලය විසින් මෙම අයගේ පදිංචිය තහවුරු නොවීම යටතේ ප්‍රතික්ෂේප කර ඇතත්, ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛනය ප්‍රකාරව ස්ථාන නිරීක්ෂණය නොකර ආදළ අයදුම්පත ප්‍රතික්ෂේප කර ඇති බව තවදුරටත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් පදිංචිය සනාථ කරමින් ග්‍රාම නිලධාරි නිකුත් කරන ලද සහතික (අවු.05) ඉදිරිපත් කර ඇත. මෙම අයගේ පදිංචිය තහවුරු කර ගැනීම සඳහා ස්ථානයට එක්වරක් ගොස් ඇති අතර, එම අවස්ථාවේ කිසිවෙකු නිවසේ නොසිටි බව නියෝජ්‍ය විදුහල්පතිවරයා සඳහන් කළද ඒ බව පරීක්ෂණ අවස්ථාවේ හෝ පසුව ලිඛිතව සනාථ කර නොමැත.

**නිගමනය :-**

පැමිණිලිකරු විසින් නියමිත පරිදි තම දරුවා ඇතුළත් කිරීම සඳහා ලේඛන ඉදිරිපත් කර ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 94 ලබාගෙන ඇති බැවින් ඔහු තාවකාලික ලේඛනයට ඇතුළත් නොකිරීම හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලය විසින්ද 29/2019 ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛනයට අනුව ඒ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් නොකර අභියාචනා ප්‍රතික්ෂේප කිරීම තුළින් පැමිණිලිකරුට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට ඇති "නීතිය පසිඳලීම, ක්‍රියාත්මක කිරීම හා නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකරුගේ දරුවා වන ජේ.ආර්. සයුල් දුල්නිත් සමරතුංග දරුවා 2021 වසරේ වගඋත්තරකාර කෑගලු විද්‍යාලයේ දෙවන ශ්‍රේණියට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021.05.03 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මං.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂ (ජාතික පාසැල්)
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/n